සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2018 | 43 | S | I |
|---|---|---|---|---|

# චිත්‍ර I

කාලය පැය 01 යි

**සැලකිය යුතුයි.**

* සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

*** පහත දැක්වෙන ඡායාරූපය ඇසුරු කරගෙන අංක 01 සිට 05 දක්වා අසා ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු සපයන්න.**



01. මෙම සිතුවම ක්‍රි.ව. 01 වන සියවසේ දී වළගම්බා රජු විසින් කරවන ලදැයි සැළකෙන ............................................... විහාර සංකීර්ණයේ සිතුවමකි.

02. වියන් තලයෙහි විශාල ප්‍රදේශයක් පුරා ඇඳ ඇති .......................................................... නැමැති සිතුවමෙහි කොටසකි.

03. මෙම සිතුවම ................................ යුගයට අයත් වේ.

04. මෙහි සිතුවම් ඇඳීමේ ගෞරවය ....................................................................... සිත්තර පරම්පරාවට හිමිවේ.

05. තවද මෙම සිතුවමෙහි බුදුන් වහන්සේ ......................................................................... මුද්‍රාවෙන් නිරූපිතය.

*** ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.**

06. බොරැල්ලේ ගෝතමී විහාරයේ සුවිශේෂී සිතුවමක් වූ මාර පරාජය සිතුවම ඇඳි ශිල්පියා නම් කරන්න?

    ..........................................................................

07. රතු සහ නිල් වර්ණ දෙක මිශ්‍ර කිරීමෙන් සෑදෙන ද්විතීයික වර්ණය කුමක් ද? ............................................

08. මිසරයේ කුරුලු දඩයම සිතුවමෙහි පසුබිමෙහි දැකිය හැකි රූපාක්ෂර කුමන නමකින් හැඳින්වේද?

    .................................................................

09. යාපනයේ සට්ටිනාදර් ශිව දේවාලයේ සිතුවම් ඇඳි ශිල්පියා නම් කරන්න. ...............................................

10. ග්‍රීක මූර්ති අතර හෙලනිස්තික් යුගයට අයත් කලා ලක්ෂණ දැකිය හැකි මූර්තිය නම් කරන්න?

    .............................................................

*** අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

11. ගල් කණු මත ඉදිකරන ලද මැදවල විහාරය හඳුන්වනු ලබන්නේ
    - i. ලෙන් විහාරයක් ලෙසටය.
    - ii. ගෙඩිගේ විහාරයක් ලෙසටය.
    - iii. ටැම්පිට විහාරයක් ලෙසටය.
    - iv. ශෛල විහාරයක් ලෙසටය.

12. කොළඹ යුගයේ ශ්‍රේෂ්ඨ චිත්‍ර ශිල්පියෙකු වූ එම්. සාර්ලිස් ශිල්පියාගේ සිතුවම්වල දැකිය හැකි විශේෂ ලක්ෂණය වන්නේ,
    - i. සම්භාව්‍ය කලා ලක්ෂණ
    - ii. බටහිර ස්වභාවිකවාදී කලා ලක්ෂණ
    - iii. සාම්ප්‍රදායික කලා ලක්ෂණ
    - iv. ඝණිකවාදී කලා ලක්ෂණ

13. පුනරුද යුගයේ ශ්‍රේෂ්ඨ චිත්‍ර ශිල්පියෙකු වූ මයිකල් ආන්ජලෝ ශිල්පියා ඇඳි සිතුවම් යුගලය වන්නේ,
    - i. ඇතැන්ස් ගුරුකුලය, ආදම් මැවීම
    - ii. ආදම් මැවීම, අන්තිම විනිශ්චය
    - iii. ඇතැන්ස් ගුරුකුලය, මොනාලිසා
    - iv. අන්තිම විනිශ්චය, තණ පිටියේ මැඩොනා

14. ගම්පොළ යුගයට අයත් තනි කළු ගලින් නිමවූ ගඩලාදෙණි විහාරයේ ගෘහ නිර්මාණ ශිල්පය වන්නේ,
    - i. චෝල කලා ශිල්පයයි.
    - ii. පාණ්ඩ්‍ය කලා ශිල්පයයි.
    - iii. ගුප්ත කලා ශිල්පයයි
    - iv. විජයනගර් කලා ශිල්පයයි.

15. ඉන්දියාවේ සාරානාත් බුද්ධ ප්‍රතිමාවෙන් නිරූපනය වන මුද්‍රාව වන්නේ,
    - i. ධ්‍යාන මුද්‍රාවයි.
    - ii. අභය මුද්‍රාවයි
    - iii. විතර්ක මුද්‍රාවයි
    - iv. ධම්මචක්ක මුද්‍රාවයි

*** අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල දී ඇති වාක්‍යවල හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර ලියන්න.**

16. පුනරුද යුගයේ චිත්‍ර ශිල්පියෙකු වන රෆායල්ගේ නිර්මාණ සඳහා ප්‍රකට තේමාවන් වූයේ .................................... සිතුවම්ය.

17. අනුරාධපුර ථූපාරාම ස්ථූපය වට කොට ලජ්ජතිස්ස රජතුමා විසින් ................................................ ඉදිකර තිබේ.

18. දේවාරාධනාව සිතුවම දැකිය හැකි ................................................................ පොළොන්නරු යුගයට අයත් කලාගාරයක් බඳු ස්ථානයකි.

19. මධ්‍යකාලීන සිංහල කලා ග්‍රන්ථයේ දැක්වෙන පරිදි ............................................. දිව්‍ය ගණයට අයත් සැරසිලි වේ.

20. රත්වත්තේ අලංකාරය නම් සැරසිල්ල ............................................. සාම්ප්‍රදායික ජන කලා කර්මාන්තයේ දී දැකිය හැකි සැරසිල්ලකි.

*** අංක 21 සිට 25 තෙක් දී ඇති රූප සටහන් කොටස්වලට සෘජු සබඳතාවයක් දැක්වෙන රූප සටහන ඉදිරියෙන් ඇති A,B,C,D,E යන රූප සටහන් අතුරෙන් තෝරා, එහි අක්ෂරය තිත් ඉර මත ලියන්න.**

21.



(........................)

A



22.



(........................)

B



23.



(........................)

C



24.  (........................) D 

25.  (........................) E 

*** අංක 26 සිට 30 තෙක් දී ඇති ප්‍රශ්න වලට F,G,H,I,J යන රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.**



F



G



H



I



J

26. F අක්ෂරයෙන් දැක්වෙන්නේ ............................................................................. දැකිය හැකි ඩේවිඩ් පේන්ටර්ගේ ජයග්‍රාහී ලෙස ජෙරුසෙලමට ඇතුළුවීමේ සිතුවමයි.

27. G අක්ෂරයෙන් දැක්වෙන ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමු වූ මෙම මුද්‍රාව ...................................................... නමින් හැඳින්වේ.

28. H අක්ෂරයෙන් දැක්වෙන කුෆු පිරමිඩය ඉදිරිපිටින් හමුවී ඇති ................................................................ මූර්තියෙන් පාරාවරුන්ගේ තෙද බල පරාක්‍රමය කියාපායි.

29. I අක්ෂරයෙන් දැක්වෙන්නේ සෝලියස් මෙන්ඩිස් ශිල්පියා විසින් කැළණි විහාරයේ ............................................ ශිල්ප ක්‍රමයට ඇඳ ඇති සිතුවමකි.

30. J අක්ෂරයෙන් දැක්වෙන ග්‍රීකයෙන් හමු වී ඇති ඇතීනා දෙවඟන මූර්තිය ........................................................... ශිල්පියාගේ නිර්මාණයකි.

*** අංක 31 සිට 35 තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිළි වන සේ සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.**

31. කැලිග්‍රැෆි - ............................................................................................................................................

............................................................................................................................................

32. කියරෝස්කුරෝ -.....................................................................................................................................

............................................................................................................................................

33. පාර්ශවදර්ශි -.......................................................................................................................................

............................................................................................................................................

34. අල්පනාව -...........................................................................................................................................

............................................................................................................................................

35. සිරස්පත - ............................................................................................................................................

............................................................................................................................................

*** මෙහි දැක්වෙන සිතුවම හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරන පරිදි අංක 36 සිට 40 තෙක් දී ඇති උප මාතෘකාවලට අදාළව අර්ථවත් වාක්‍ය 05 ක් ලියන්න.**



36. හඳුනාගත් බව - ..............................

37. ශිල්පියා - ..............................

38. මාධ්‍ය - ..............................

39. භාව ප්‍රකාශනය - ..............................

..............................

..............................

40. ශිල්පීය කුසලතා- ..............................

..............................

..............................

..............................

..............................

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2018 | 43 S II |
| --- | --- | --- |

## චිත්‍ර II

කාලය පැය 02 යි

**සැලකිය යුතුයි.**

* ඔබේ විභාග අංකය උත්තර පත්‍රයේ පසුපිටේ පැහැදිලිව ලියන්න.
* උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාරදෙන විට වියළී තිබිය යුතුය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකිය.
* දිය සායම්, පෝස්ටර් සායම්, ටෙපරා සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිතා කළ හැකිය.

- ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කර,
  1. රේඛා මඟින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න.
  2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ වර්ණ කරන්න.
- මෙම චිත්‍ර දෙකම එකට අමුණා විභාග ශාලාධිපතිට භාරදෙන්න.
- ඔබගේ චිත්‍ර ඇගයීමේ දී පහත කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සළකන්න.

❖ **රේඛා අධ්‍යයනය**

1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව අධ්‍යයනයේ දී දක්වා ඇති කුසලතාවය

❖ **වර්ණ චිත්‍රය**

1. ද්‍රව්‍ය සමූහය තලය මත කලාත්මකව සම්පිණ්ඩනය කිරීම.
2. පරිමාණය, පර්යාවලෝක රීති සහ ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය
3. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය සහ ගති ලක්ෂණ දැක්වීම.
4. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතා
5. උචිත පසුබිමක් යෙදීම සහ සමස්ත නිමාව.

**සැලකිය යුතුයිඃ**

- ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල විශාල ලෙස ඇඳීම අවශ්‍ය නොවේ. ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැළපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2018 | 43 S III

**චිත්‍ර III** — කාලය පැය 02 යි

**සැලකිය යුතුයි.**

* ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.
* ඔබගේ විභාග අංකය හා අදාළ ප්‍රශ්න අංකය උත්තර පත්‍රයේ පසුපිටේ පැහැදිලිව ලියන්න.
* උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාරදෙන විට වියළී තිබිය යුතුය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකිය.
* දිය සායම්, පෝස්ටර් සායම්, ටෙම්පරා සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිතා කළ හැකිය.

❖ "අ" කොටසින් හෝ "ආ" කොටසින් හෝ "ඇ" කොටසින් එක් මාතෘකාවක් පමණක් තෝරාගන්න.

**(අ) කොටස - චිත්‍ර සංරචනය**

1. පාසලේ ශ්‍රමදානය දා
2. වැසි දිනයක්
3. වැවක් අසල සතුන් නරඹන සංචාරකයන්
4. වළං තෝරන ගැමි ළඳුන්

**(ආ) කොටස - මෝස්තර නිර්මාණය**

5. පෙති පහක මලක් ඇසුරු කර ගනිමින් අඟල් 9x9 ප්‍රමාණයේ මෝස්තර කොටසක් ඇඳ වර්ණ කරන්න.
6. සංස්කෘතික උත්සවයක් සඳහා සුදුසු පතාකයක් සැලසුම් කරන්න.
7. සාම්ප්‍රදායික මෝස්තර ඇසුරින් විදුලි පහන් ආවරණයක් නිර්මාණය කරන්න.

**(ඇ) කොටස - ග්‍රැෆික් නිර්මාණ**

8. ළමා කතන්දර පොතක් සඳහා උචිත පොත් පිට කවරයක් නිර්මාණය කරන්න. (සුදුසු මාතෘකාවක් යොදන්න.)
9. ඩෙංගු උවදුර තුරන් කිරීම සඳහා සුදුසු පෝස්ටරයක් නිර්මාණය කරන්න.
10. පාසලේ විද්‍යා සංගමය සඳහා සුදුසු ලාංඡනයක් නිර්මාණය කරන්න.

**වර්ෂ අවසාන පරීක්ෂණය - 2018**
**චිත්‍ර - 10 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය**

*** යෝජිත ද්‍රව්‍ය**

1. කාඩ්බෝඩ් පෙට්ටියක් (25cm,20cm,10cm) ඉවත දමන බිස්කට් පෙට්ටියක්, සුදු කඩදාසියකින් ආවරණය කරගන්න.
2. අත් පන්දුවක් හෝදැල් පන්දුවක්
3. කොටු රෙදි කැබැල්ලක් (මීටර් 1/2 ක් පමණ)
4. වීදුරු බෝතලයක් (750 ml)
5. ක්‍රෝටන් අත්තක් (කොළ 05 ක් පමණ යුතු)
6. ද්‍රව්‍ය සමූහය තැබීමට සුදුසු ආධාරකයක්

| | | | |
|---|---|---|---|
| 1. දඹුලු | 2. මාර පරාජය | 3. මහුනවර | 4. නීලගම |
| 5. භූමි ස්පර්ශ | 6. ජෝර්ජ් කීට් | 7. දම් වර්ණය | 8. හයිරොග්ලිපික්ස් |
| 9. තාවඩි මු. තුරෙයිසාමි | 10. ලැඹකුන් | 11. iii | 12. iii |
| 13. ii | 14. iv | 15. 04 | 16. මැඩෝනා |
| 17. වටදාගෙය | 18. තිවංක පිළිම ගෙය | 19. ඉර /හඳ | 20. දුම්බර පැදුරු |
| 21. C | 22. A | 23. B | 24. E |
| 25. D | 26. ජාතික කලා භවනේ | | 27. පශුපති |
| 28. ස්පිනික්ස් | 29. ටෙම්පරා | 30. පීඩියස් | |

31. කුරානයේ ඇතිපාය අරාබි බසින් පල්ලියේ බිත්ති මත විචිත්‍රවත්ව ලිවීමේ කලාව

32. සිතුවම් වර්ණ කිරීමේ දී අඳුර තුළින් ආලෝකය වඩාත් තීව්‍ර ලෙස මතුකර දැක්වීමේ ශාස්ත්‍රාලීය සිද්ධාන්තය

33. මහනුවර යුගයේ සිතුවම්වල මානව රූප ඇඳීමේ දී හිස හා පාදයන් පැත්තට හැරුණු ආකාරයට ඇඳීම

34. උත්සව අවස්ථාවකදී පොල් තෙල් පහන තබන ස්ථානයේ බිම අලංකාර කරන සැරසිලි රටාව.

35. මහනුවර යුගයේ දී බුද්ධ ප්‍රතිමාවේ ශීර්ෂයේ උෂ්නිස මත නිර්මාණය කරන ලද කලා අංගය.

36. කුරුසියෙන් ඉවත් කරන ලද මිය ගිය ජේසුස් වහන්සේගේ අප්‍රාණික සිරුර මරිය මව්තුමිය විසින් උකුලෙහි හොවාගෙන සිටින ආකාරය දැක්වෙන පියෙටා මූර්තියයි.

37. පුනරුද යුගයේ සිටි චිත්‍ර, මූර්ති හා කැටයම් කලාව හා වාස්තු විද්‍යාව සඳහා සහජ දක්ෂතාවයක් දැක් වූ මයිලකල් ආන්ජලෝ නම් ප්‍රතිභා පූර්ණ ශිල්පියාගේ නිර්මාණයකි.

38. මෙම මූර්තිය කිරිගරුඬ මාධ්‍යයෙන් නෙළා ඇත.

39. 
- ❖ ආගමික තේමාවක් නිරූපණය කරන මෙම නිර්මාණයෙන් නරඹන්නා තුළ හැඟුම්බර අවස්ථාවක් පිළිඹිබු කරයි.
- ❖ මානුෂිකත්වය පිළිබඳ අනුවේදනීයත්වය මෙම මූර්තියෙන් මනාව පිළිබිඹු කරයි.

40. 
- ❖ මෙම මූර්තියේ ජේසුස් වහන්සේගේ අප්‍රාණික ශරීර ස්වභාවය තාත්විකව නිරූපණය කොට ඇත.
- ❖ මරියතුමියගේ සළුපිළිවල රිද්මයානුකූල බව ඉතා ස්වභාවිකව නිරූපණය කොට ඇත.
- ❖ මව හා පුතු සම වයස්ව දැක්විමෙන් දිව්‍යමය ස්වභාවය මතු කිරීමට ශිල්පියා උත්සහ ගෙන ඇත.

